වත්තේගම නගර සභාව
මහනුවර දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
------------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 මැයි 23 දින ද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2019 මැයි 31 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
---------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට වත්තේගම නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
-----------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාව සතු රු.3,425,000 වටිනා බැකෝ යන්ත්‍රය ගිණුම්ගත කර නොතිබුණු අතර, භෞතිකව නොතිබුණු රු.221,570 ක් වටිනාකම වූ වාහන 03 ක් ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කල යුතුවේ. | පිළිගනිමි. ඉදිරි වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | 2007 සිට 2010 දක්වා පෙර ගෙවුම්වල එකතුව රු.563,628 ක් අදාළ ගිණුම්වල ගැළපීම් කර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | මෙම මුදල ප්‍රධාන ලේකම් වෙත දන්වා ප්‍රතිපූරණය කිරීමට ඉල්ලීම් කර ඇත. |
| (iii) | ලී බඩු උපකරණ රු.175,230 ක් අඩුවෙන් දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2019 වර්ෂයට මූල්‍ය ප්‍රකාශන මඟින් නිවැරදි කිරීමට කටයුතු කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන එකතුව රු.2,518,738 ක් වූ ගිණුම් විෂයන් 02 කට අදාළ ශේෂයන් හා උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු.363,967 ක වෙනසක් විය. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා නිවැරදි කිරීම් කළ යුතුවේ. | 2019 මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වර්ෂ 5 කට වැඩි රු.2,061,703 ක ලැබිය යුතු ශේෂයක් විය. | ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | රු.521,326 ක මුදල ප්‍රතිපූරණය කර ගැනීමටත්, රු.1,452,025 ක් සොයාගත නොහැකි නිසා ඒ සම්බන්ධව ඉදිරි කටයුතු කිරීමට සභාවට යොමු කිරීමටත්, රු.381,014 ක උසාවි දඩ කපා හැරීමට හා ඉතිරි මුදල් ලබා ගැනීමටත් කටයුතු කරමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වටිනාකම රු.1,467,274 ක් වූ ගිණුම් විෂයයන් 3 කට අදාළ ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා විගණනයේදී ඒවා සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය. | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් ශේෂ තහවුරු කරන සාක්ෂි ඉදිරිපත් කළ යුතුවේ. | ලිඛිත සාක්ෂි සොයාගත නොහැකි බැවින් කපා හැරීමට ඉදිරි මහා සභාවට යොමුකර අවශ්‍ය කටයුතු කරමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.13,212,819 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.12,642,099 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,284,500 | 16,807,420 | 11,687,897 | 5,119,523 | 15,316,050 | 15,927,065 | 11,814,985 | 4,112,080 |
| (ii) | කුලී | 6,162,400 | 5,262,080 | 5,022,080 | 239,809 | 4,573,700 | 4,142,965 | 4,266,570 | (123,605) |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,021,000 | 1,011,150 | 1,006,150 | 5,000 | 700,000 | 766,220 | 765,220 | 1,000 |
| (iv) | වෙනත් ආදායම් | 2,154,500 | 2,613,700 | 2,613,700 | 2,000,000 | 1,988,500 | 2,341,480 | 2,341,480 | - |
| | | 24,622,400 | 25,694,350 | 20,329,827 | 7,364,332 | 22,578,250 | 23,177,730 | 19,188,255 | 3,989,475 |

### 2.2.2 ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ රැස්කළ යුතු සමස්ථ ආදායම රු.29,683,825 ක් වුවද, වර්ෂය තුළ රැස් කරන ලද ආදායම රු.20,329,827 ක් වීමෙන් ආදායම් රැස්කිරීමේ ප්‍රගතිය සියයට 68 ක් විය. | හිඟ ආදායම් අයකර ගත යුතුවේ. | නිරීක්ෂණය පිළිගනිමි. |

### 2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ලැබිය යුතුව තිබූ උසාවි දඩ රු.1,081,014 ක් හා මුද්දර ගාස්තු රු.2,700,000 ක් විය. | අදාළ මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | උසාවි දඩ මුදලින් රු.27,000 ක් අයකරගෙන ඇති අතර, රු.381,014 ක් කපා හැරීමට මහා සභා තීරණයක් ගෙන ඇති අතර මුද්දර ගාස්තුවලින් රු.1,007,390 ක් ලැබී ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

නගර සභා ආඥා පනතේ 4 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නගර සභා ආඥා පනතේ 157 වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 15 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබූ නමුත් කාරණා 08 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා තිබුණි. | සභාවට ආදායම් උපයාගතහැකි අතුරු ව්‍යවස්ථා පනවා ආදායම් උපයා ගැනීමට කටයුතු කළ යුතු වේ. | අතුරු ව්‍යවස්ථා සම්බන්ධයෙන් මහ සභාව දැනුවත් කර අනුමැතියෙන් පසුව සකස් කරන බව සඳහන් කරමි. |

#### (ආ) තිරසර සංවර්ධන ඉලක්ක

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟා කර ගැනීමට හා ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි. | තිරසර සංවර්ධන ඉලක්ක හඳුනාගෙන ඒවා ළඟාකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | 2018 වර්ෂයේ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කළ අතර, එම වැඩසටහන් යටතේ බෝග ලබා දීම හා කොම්පෝස්ට් බඳුන් ලබාදීම සිදුකරන බවත් දන්වමි. |

### 3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නාගරික සංවර්ධන අධිකාරි ගිණුමේ පවතින රු.1,211,182 ක මුදල සංවර්ධන කටයුත්තකට යොදා ගැනීමට කටයුතු කර නොතිබුණි. | සංවර්ධන කටයුතු සඳහා වැය කළ යුතුවේ. | වත්තේගම නගර සංවර්ධන වැඩසටහන යටතේ ළමා උද්‍යාන, පොදු රථගාල හා සතිපොල ඉදිකිරීම් ව්‍යාපෘතිය සඳහා මෙම මුදල යෙදවීමට අපේක්ෂා කරමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | කාර්ය මණ්ඩලයේ තනතුරු 8 ක පුරප්පාඩු 9 ක් විය. | පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුවේ. | බඳවා ගැනීමට කටයුතු කරමින් පවතී. |
| (ආ) | ස්ථානමාරු වී ගිය නිලධාරීන් 5 දෙනෙකුගේ අය නොවන රු.558,621 ක ණය ශේෂයක් පැවතුණි. | සේවක ණය අයකර ගැනීමට කටයුතු කළ යුතුවේ. | සමහර ණය ශේෂ වාරික වශයෙන් අයවන අතර, ඉතිරිය ප්‍රතිපූරණය කිරීමට කටයුතු කරමින් පවතී. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වත්කම්වල ආරක්ෂාව තහවුරු නොකිරීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| නුවරතැන්නවෙළ නැමැති ඉඩමෙන් අක්කර 1 රූඩ් 2 පර්චස් 37.22 ප්‍රමාණයක පුද්ගලයන් 17 දෙනෙකු හා දෙල්ගහලන්ද ඉඩමෙන් අක්කර 3 රූඩ් 2 පර්චස් 30 ක ප්‍රමාණයක පුද්ගලයන් 30 දෙනෙකු අනවසරයෙන් භුක්ති විඳිමින් පැවතුණ ද මේ සම්බන්ධ කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | සභාව සතු වත්කම් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුවේ. | අනවසර පදිංචිකරුවන් 17 දෙනෙකු සම්බන්ධයෙන් මහා සභාවට යොමු කිරීමට කටයුතු කර ඇති අතර, මහා සභාවෙන් ලබාදෙන තීරණය අනුව ඉදිරි කටයුතු කරමි. |

3.4.2 නිෂ්ක්‍රීය / ඌන උපයෝජිත වත්කම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| රු.333,700 ක් වටිනා වඩු යන්ත්‍රය හා රු.129,500 ක් වටිනා විදුලි ජනන යන්ත්‍රය නිෂ්කාර්යව පැවතුණි. | අලුත්වැඩියා කර ප්‍රයෝජනයට ගැනීමට හෝ අපහරණය කිරීම කළ යුතුවේ. | විදුලිජනන යන්ත්‍ර 4 න් 3 ක් ප්‍රයෝජනයට ගන්නා අතර කිලෝවොට් 10 යන්ත්‍රය විකිණීමට කටයුතු කරගෙන යනු ලැබේ. |

3.5 ප්‍රසම්පාදනය

----------------

කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| නගර සභා ප්‍රතිපාදන මඟින් 2018 වර්ෂයේදී නගර සභා ශාලාව අලුත්වැඩියා කිරීම සඳහා රු.1,568,990 ක වගකීමකට කොන්ත්‍රාත්කරුවකු සමඟ ගිවිසුම්ගතව වැඩ නිමකර රු.1,525,268 ක් ගෙවා තිබුණි. ප්‍රසම්පාදන දැන්වීම් සභා කාර්යාලයේ දැන්වීම් පුවරුවේ පමණක් පළකර කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණු අතර, සභා ලේකම් පමණක් ටෙන්ඩර් විවෘත කර තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවට අදාළ විෂයය සම්බන්ධ විශේෂඥයකු සහභාගී කරගෙන නොතිබුණු අතර, නොමේරු ලී භාවිතා කර සභා ගර්භය සකස් කිරීම හේතුවෙන් 2019 අප්‍රේල් 09 දින පරීක්ෂණ අවස්ථාව වන විට සභා මේසයේ ලෑලි ඇත් වී තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවේ. | ටෙන්ඩර් කැඳවීම් කර ඇත්තේ ප්‍රාදේශීය මට්ටමිනි. සභා බල ප්‍රදේශය ඉතා කුඩා බැවින් ස්ථාන 4 ක පමණක් දැන්වීම් පළකරන ලදී. ටෙන්ඩරය විවෘත කිරීමේදී සභාවේ ලේකම්වරයා පමණක් අත්සන් යොදා තිබුණි. තාක්ෂණික ඇගයීම් කමිටුවට ප්‍රවීනයෙකු සහභාගී කර නොගත් අතර, අධික උෂ්ණත්වය නිසා සභා මේසයේ ලෑලි ඇත්වී තිබුණු බව දන්වමි. |